Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ තාක්ෂණ නිලධාරි තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම

## පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ තාක්ෂණ නිලධාරි තනතුරේ පවතින එක් පුරප්පාඩුවක් පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන ලිඛිත තරඟ විභාගයක මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

ලිඛිත විභාගය සඳහා පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 40% |

02. *කාර්යභාරය :*

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය, ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය පදනම් කොටගෙන සිදු කළ යුතු වේ. ප්‍රධාන වශයෙන් පහත පරිදි අමාත්‍යාංශයේ නඩත්තු අංශයේ කටයුතු මෙහෙයවීම හා ව්‍යාපෘති සම්බන්ධීකරණ කටයුතු වලදී තාක්ෂණික සහාය ලබා දීම අපේක්ෂා කෙරේ.

I. ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තුව සඳහා මිනුම් පත්‍ර ඇස්තමේන්තු පිළියෙල කිරීම හා බිල්පත් පරීක්ෂාව/ගෙවීම.
II. පළාත්/ග්‍රාමීය මාර්ග ඉදිකිරීම් හා නඩත්තුව සඳහා මිනුම් පත්‍ර ඇස්තමේන්තු පිළියෙල කිරීම හා බිල්පත් පරීක්ෂාව/ගෙවීම.
III. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, කොම්පෝස්ට් අංගන ඉදිකිරීම් හා නඩත්තුව
IV. සපත්තු පාලම්, බෝක්කු, පැති බැම් නඩත්තුව හා මිනුම් පත්‍ර සකස් කිරීම
V. ජල සම්පාදන හා ජල පවාහන, ඉදිකිරීම් නඩත්තුව සඳහා ඇස්තමේන්තු සකස් කිරීම
VI. ප්‍රසම්පාදන තාක්ෂණික ඇගයීම් වාර්තා පිළියෙල කිරීම, කොන්ත්‍රාත් ගිවිසුම් සම්බන්ධ දැනුම

03. අවශ්‍ය සුදුසුකම් :

3.1 අධ්‍යාපන සුදුසුකම් :

ක්ෂේත්‍රයට අදාල විෂයන් 02ක් සහිතව විද්‍යා/ගණිත හා තාක්ෂණවේදය යන විෂය ධාරාවට අයත්, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, තාක්ෂණය සහ විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ඉංජිනේරු තාක්ෂණවේදය යන විෂයන් 03කින් අ.පො.ස. උ/පෙළ විභාගය එකවර සමත්වීම. (සාමාන්‍ය ඉංග්‍රීසි හා පොදු පරීක්ෂණය හැර) ;

*සහ*

සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06කින් අ.පො.ස. සා/පෙළ විභාගය සමත් වී තිබීම.

3.2 වෘත්තිය සුදුසුකම් :

I. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

*හෝ*

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව

*හෝ*

III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව ;

*හෝ*

IV. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව ;

*හෝ*

V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම ; *හෝ*

VI. රැකියා ක්ෂේත්‍රයට අදාල ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම ;

*හෝ*

VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණික සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

3.3 පළපුරුද්ද : අදාළ නොවේ.

3.4 *කායික සුදුසුකම්* :- ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

3.5 වෙනත්

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
III. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
IV. සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදල සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

04. වයස් සීමාව :

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

05. වැටුප් පරිමාණය :

මෙම තනතුරට රු.31,040/- 10x445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 57,550/- ක මාසික වැටුප් පරිමාණයක් හිමිය. මෙම වැටුප් පරිමාණයට අදල ගෙවීම සිදු කරනු ලබන්නේ 2020.01.01 වැනි දිනට වන අතර, එදින දක්වා ගෙවීම් සිදු කරනු ලබන්නේ රා.ප.ච. 03/2016 හි II උපලේඛනයෙහි විධිවිධානයන්ට යටත්ව ය.
(2018 වර්ෂයට හිමි මාසික වැටුප රු. 24,626/-ක් වන අතර, ගැලපුම් දීමනාව රු. 3,380/- ක් වේ.)

06. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

6.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුවේ. ඔබ වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.
6.2 ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යාවස්ථාවට අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ හා රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතු වේ.
6.3 මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන, ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථා විධිවිධාන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ තාක්ෂණ නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් විධිවිධානයන්ට හා ඊට මතුවට කරනු ලබන්නා වූ සංශෝධන සහ විධිවිධානයන්ට යටත් වේ.

07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

7.1 ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

7.2 සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල්පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

7.3 සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත

II. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

8.1 අයදුම්පත් 2018.04.23 වැනි දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කල යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
අංක. 330, යූනියන් පෙදෙස,
කොළඹ 02.

8.2 ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 03 දක්වාත්, 02 වන පිටුව අංක 4.1 - 4.3 දක්වාත්, තෙවන පිටුව අංක 05 - 07 දක්වාත්, හතරවන පිටුව අංක 08 කොටසත්, වශයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කල යුතුය.

8.3 අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "තාක්ෂණ නිලධාරි තනතුර සඳහා අයදුම්පත්‍රය" යනුවෙන් සඳහන් කල යුතුය.

8.4 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 37,743 කට වැඩි මූලික මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

8.5 දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙහි නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කල යුතුය.

8.6 මේ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම :*

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදල ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

එච්.ටී. කමල් පත්මසිරි,
ලේකම්,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,

2018 පෙබරවාරි මස 22 වැනි දින,
කොළඹ 02.

| |
|---|
| |

කාර්යාල ප්‍රයෝජනය සඳහා

*පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ තාක්ෂණ නිලධාරි තනතුරට බඳවා ගැනීම*

අයදුම් කරන භාෂා මාධ්‍යය :
සිංහල - 1
දෙමළ - 2 [ ]
ඉංග්‍රීසි - 3

1\. 1.1 මුලකුරු සමග නම : (Mr./Mrs./Miss) : ——————
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.2 සම්පූර්ණ නම : ——————
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.3 සම්පූර්ණ නම : ——————
(සිංහලෙන්)

2\. 2.1 ස්ථිර ලිපිනය : ——————

2.2 දුරකථන අංකය :
ස්ථාවර : —————— ජංගම : ——————

3\. 3.1 ජනවර්ගය : [ ]
(සිංහල - 1, දෙමළ - 2, මුස්ලිම් - 4, වෙනත් - 5)

3.2 ස්ත්‍රී/පුරුෂ භාවය :

| | |
|---|---|
| ස්ත්‍රී | |
| පුරුෂ | |

3.3 විවාහක/අවිවාහක බව :

| | | | |
|---|---|---|---|
| විවාහක | | අවිවාහක | |

3.4 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

3.5 උපන් දිනය : වර්ෂය —— මාසය —— දිනය ——

3.6 2018.04.23 වැනි දිනට වයස : අවුරුදු .................... මාස ..................... දින ....................

4. සුදුසුකම් :

4.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

I. විභාගයේ වර්ෂය හා මාසය : ........................................................................................
II. විභාග අංකය : ........................................................................................
III. ප්‍රතිඵල

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

IV. විභාගයේ වර්ෂය හා මාසය : ..............................................................................................
V. විභාග අංකය : ..............................................................................................
VI. ප්‍රතිඵල :

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

4.3 වෘත්තීය සුදුසුකම් (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ දක්වා ඇති වෘත්තීය සුදුසුකම්) :
.................................................................................................................................................................
.................................................................................................................................................................
.................................................................................................................................................................

5. යම් කිසි සාපරාධි වරදකට උසාවියේ දී චෝදනා ලබා තිබේ ද? එසේ නම් දිනය හා නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සපයන්න :
.................................................................................................................................................................
.................................................................................................................................................................
.................................................................................................................................................................

6. *අයදුම්කරුගේ සහතිකය :*

මෙම අයදුම්පත්‍රයේ සපයා ඇති විස්තර සත්‍ය බව ද නිවැරදි බව ද, මෙම මෙයින් සනාථ කරමි. මෙහි ඇතුලත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුණහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමට ද, මෙම තනතුරට මා පත් කර ගැනීමෙන් පසුව එම වරද දැන ගැනීමට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වන බව දනිමි.

දිනය :- ...................................... .....................................................,

ඉල්ලුම්කරුගේ අත්සන.

7. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු / නීතිඥවරයෙකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 37,743/- කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් හෝ සහතික කරනු ලැබ තිබිය යුතු ය.

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ........................................................................................................ (සම්පූර්ණ නම) මහතා/ මහත්මිය/ මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්.................................................................. දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් සහතික කරමි.

.................................................................. .
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන)

දිනය :
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :
තනතුර : ........................................................................................................................................................................
ලිපිනය : ........................................................................................................................................................................
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතු ය.)

8. ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ........................................................................... (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, ................................................................ දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ තැබූ බවත් සහතික කරමි. ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම හා හැසිරීම ............................................... බවත් මම සහතික කරමි. දැනට දරන තනතුරෙන් ඔහු/ඇය මුදා හැරිය හැකිය/නොහැකි ය.

...........................................................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන)

දිනය :
නම : ........................................................................................................................................................................
තනතුර : ........................................................................................................................................................................
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතු ය.)